www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව ආරක්ෂක හමුදා වියදම් ඉහල නංවයි

### Sri Lankan government boosts spending on security forces

**සමන් ගුනදාස විසිනි.**
**2015 ඔක්තෝබර් 30**

ශ්‍රී ලංකා මුදල් අමාත්‍ය රවි කරුනානායක ඊලඟ වසර සඳහා වන අයවැයට පෙර, ඔක්තෝබර් 23 දා ඉදිරිපත් කල විසර්ජන පනත් කෙටුම්පතින්, ආරක්ෂක වියදම් සඳහා පෙර නොවූ විරූ රුපියල් බිලියන 306 (ඇ. ඩොලර් බිලියන 2.2) ක මුදලක් වෙන් කර තිබේ. අයවැය යෝජනා නොවැම්බර් 20 දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

ආරක්ෂක හමුදා සඳහා මෙම වෙන්කිරීම, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ රජය විසින් සකස් කෙරුනු මේ වසර සඳහා වූ ප්‍රතිපාදන හා සසඳන කල සියයට 7 ක වැඩිවීමකි. ලබන වසරට පොලීසිය සඳහා අමතර රුපියල් බිලියන 60 ක් වෙන් කර ඇති අතර එය මේ වසර හා සැසඳීමේදී සියයට 18 ක වැඩිවීමකි. හමුදා සහ පොලීසිය සඳහා වෙන් කල මුලු අයවැය, අධ්‍යාපන හා සෞඛ්‍යය සඳහා වෙන් කල පිලිවෙලින් බිලියන 186 හා බිලියන 174 වඩා වැඩිය.

අධ්‍යාපන වියදම් දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2 දක්වා අනුක්‍රමිකව පහත හෙලීමෙන් අනතුරුව මෙම ඉහල දැමීම සිදු විය. ලබන වසරේදී අධ්‍යාපන වියදම් හතර ගුනයකින් ඉහල නංවන බවට ආන්ඩුවේ ඇමතිවරු කයිවාරු ගැසූහ. අඩු පහසුකම් ගැන විරෝධය පල කරන විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන් අතර පවතින කෝපය වෙනතකට හැරවීම මෙම ඉහල දැමීමේ අරමුනයි.

දිවයින තුල දිග්ගැස්සී ගිය වර්ගවාදී යුද්ධය නිමා කරමින්, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) පරාජය කර හය වසරකට පසු ආරක්ෂක හමුදා සඳහා මෙම දැවැන්ත මුදල වෙන්කර තිබේ. ඉහල දැමූ ආරක්ෂක ප්‍රතිපාදන කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට එරෙහිව එල්ල කරනු ලබන ප්‍රහාරයන් සමග එකට පෙල ගැසෙන අතර එය කම්කරුවන්ගේ හා දුගීන්ගේ ප්‍රතිරෝධය මැඩීම සඳහා වන පෙර සූදානමකි.

අයවැය යෝජනා සකස් කෙරෙන්නේ, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ආන්ඩුව ගැඹුරු මූල්‍ය ගැටලු වලට හා අනතුරුදායක ගෙවුම් ශේෂ අර්බුදයකට මුහුන පා ඇති කොන්දේසි හමුවේය.

නය ආපසු ගෙවීම් අත් හල විට, 2016 සඳහා සමස්ත තක්සේරු ගත රජයේ වියදම රුපියල් ට්‍රිලියන 1.9 කි. ප්‍රධානකොටම දැවැන්ත නය වාරික ගෙවීම් සඳහා, 2016 දී රුපියල් ට්‍රිලියන 1.3 ක් නයට ගැනීමට රජය අපේක්ෂා කරයි. 2014 දී, නය සේවා සඳහා රුපියල් ට්‍රිලියන 1.07 ක් අවශ්‍ය වූ අතර එය සියලු බදු වලින් එකතු කල සමස්ත ආදායම වූ රුපියල් ට්‍රිලියන 1.05 ට වඩා වැඩි විය.

සියයට 6.8 ක ඉහල පොලී අනුපාතයකට දස අවුරුදු ගෝලීය රාජ්‍ය බැඳුම්කර විකිනීමෙන් මහ බැංකුව ඇ. ඩොලර් බිලියන 1.5 ක් ලබා ගත්තේ ඔක්තෝබර් 28දාය. අයවැය හිඟය පියවා ගැනීමට එම මුදල් යොදවන බවට මුදල් අමාත්‍යාංශ මූලාශ්‍ර උපුටා දක්වමින් රොයිටර් වාර්තා කලේය. පසු ගිය මාස 10 තුල, ඉන්දියාවෙන් ලබා ගත් ඩොලර් බිලියන 1.5 ද ඇතුලුව ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය වෙලඳපොලෙන්, ඩොලර් බිලියන 2.3 ක් ලබා ගෙන තිබේ.

ගිය සතියේ කොලඹදී පැවති සම්මන්ත්‍රනයකදී අදහස් දක්වමින් ආර්ථශාස්ත්‍රඥ දුෂිනී වීරකෝන්, "ආන්ඩුව දැවැන්ත විදේශ සංචිත අර්බුදයක් කරා ලඟා වෙමින් සිටින" බවට අනතුරු ඇඟවීය. රජයට ඇත්තේ මාස හතරක ආනයන සඳහා පමනක් සෑහෙන ඩොලර් බිලියන 4.5 ක විදේශ සංචිත බව ඇය සඳහන් කලාය.

සංචිතවල ප්‍රධාන කොටසක් සමන්විත වන්නේ ඉහල පොලී අනුපාත යටතේ ජාත්‍යන්තර මූල්‍ය වෙලඳපොලෙන් ලබා ගත් නය වලිනි. 2010 දී දදේනියෙන් සියයට 36 ක් වූ ශ්‍රී ලංකාවේ විදේශ නය මෙම වසරේ දී සියයට 94 දක්වා ඉහල ගොස් තිබේ.

පසුගිය වසරේ ඇ. ඩො. මිලියන 2150 ක අතිරික්තයක් පැවති වසරේ පලමු මාස අට තුල ගෙවුම් ශේෂය මෙම වසරේ දී ඇ. ඩො. මිලියන 1,795ක

හිඟයක් වී තිබේ. මීට ප්‍රධාන හේතුව, ගෝලීය අවපාත ප්‍රවනතා හා නැගී එන භූ දේශපාලනික ආතතීන් අපනයනය මත බලපෑම නිසා වෙලඳ හිඟය පුලුල් වීමයි.

අපනයන පහත වැටීම හමුවේ වසරේ පලමු මාස අට සඳහා වෙලඳ හිඟය ඇ. ඩො. මිලියන 5,412 දක්වා ඉහල නැගී ඇත. තේ, රෙදි පිලි හා ඇඟලුම් ඇතුලු "සියලු ප්‍රධාන අපනයන ප්‍රභේදයන්ගේ පහත වැටීම" මහ බැංකුව වාර්තා කලේය. පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ පලමු මාස අට තුල සමස්ත අපනයන ආදායම සියයට 3.4න් පහත වැටී තිබේ.

ප්‍රධානකොටම මැද පෙරදිග රටවල ගෘහ සේවිකාවන් ඇතුලු විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේශන හා සංචාරකයන්ගෙන් ලැබෙන ආදායම නොවන්නට, ගෙවුම් ශේෂ අර්බුදය තව දුරටත් ඉහල යා හැකිව තිබිනි. මැද පෙරදිග පවතින අස්ථාවර තත්වය නිසා සුවිශේෂ වශයෙන්ම ප්‍රේෂන සිඳී යාමේ අවදානම තදින්ම මතුව තිබේ.

ගෙවුම් ශේෂ දුෂ්කරතාවයන්ට මුහුන දී ඇති තත්වය තුල ජාමූඅ ට ඉදිරිපත් කල ඇඩො බිලියන 4.6ක නය ඉල්ලුම්පත පිලිබඳව සාකච්චා යලි ඇරඹීම පිලිබඳව මුදල් ඇමති ඇඟවුම් කලේය. ආන්ඩුව අය වැය පරතරය කපා හැරිය යුතු බව පවසමින් එවන් ඉල්ලීමක් පසුගිය මාර්තුවේදී ජාමූඅ විසින් ප්‍රතික්ෂේප කෙරින. අසහනය දුරු කිරීම එල්ල කරගෙන පෙබරවාරියේදී රාජ්‍ය අංශයේ වැටුප් හා විශ්‍රාම වැටුප් ඉහල දැමීම පිලිබඳව එය අතිශයින්ම විවේචනශීලී විය. මූලිකව 2006 සිට රාජ්‍ය අංශයේ වැටුප් කැටි කර තිබිනි.

මෙම වසර සඳහා වන අය වැය පරතරය දදේනි න් සියයට 6.5-6.8 පමන වෙතැයි බලාපොරොත්තු විය හැකි බව කරුනානායක පැවසීය. සැප්තැම්බරයේ ලංකාවට පැමිනි ජාමූඅ නියෝජිතයින් "2016 මූල්‍ය පරතරය දදේනි යෙන් සියයට 5.5 පවත්වා ගත යුතු බවට දැඩිව රෙකමදාරු කරන" බව පැවසීය. එහි අර්ථය, ආන්ඩුවේ වියදම් තව දුරටත් කපා හැරිය යුතු බවට ජාමූඅ නියම කර ඇති බවයි.

මෙම සන්දර්භය තුල, නොවැම්බර් අය වැයෙහි රුදුරු කප්පාදු පියවරයන් ඇතුලත් වන බවට දැඩිව අනුමාන කල හැක. සුභසාධන කටයුතු වැනි අත්‍යාවශ්‍ය සමාජ සේවා කපා හැරීම, කම්කරු පීඩිත ජනතාවගේ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා බදු ඉහල දැමීම මීට අයත් වනු ඇත.

නිදහසේ පා වීමට ඉඩ හරිමින් ආන්ඩුව දැනටමත් රුපියල අවප්‍රමානය කර ඇති අතර එය ජාමූඅ පැසසුමට ලක් විය. මහ බැංකුව සැප්තැම්බරයේදී රුපියල පා වීමට හැරීමෙන් පසුව සියයට 4.4න් එහි අගය ක්ෂනිකව පහත වැටුනු අතර, පසුගිය මාස 10 තුල එහි අගය සියයට 7න් කඩා වැටී ඇත.

අවප්‍රමානය මගින් අත්‍යාවශ්‍ය ද්‍රව්‍යද ඇතුලු සියලු ආනයන භාන්ඩ වල මිල ඉහල ගියේය. පරිප්පු, වියලි මිරිස්, කව්පී, වියලි හාල්මැස්සන්, කඩල, ලූනු හා අල වැනි ආහාර ද්‍රව්‍යවල මිල ද ඉහල දැමුනු අතර අල, සීනි, පරිප්පු, කුරක්කන්, මාගරීන් හා ග්‍රීන් පීස් වැනි ආහාර ද්‍රව්‍යවල බදු ඉහල දැමීම් මුදල් අමාත්‍යාංශය මෑතදී නිවේදනය කලේය. අය වැය විසර්ජන පනත ඉදිරිපත් කිරීමට සති තුනකට පෙර මධ්‍යසාර හා දුම්කොල සඳහා බදු සියයට 10න් ඉහල දැමිනි.

ජාමූඅ ද රජයට අයත් ව්‍යවසායයන් සඳහා ප්‍රධාන ප්‍රතිව්‍යුහගත කිරීමක් නියම කර තිබේ. එහි සැප්තැම්බර් ප්‍රකාශනයට අනුව " (මිල නියම කිරීම් ද ඇතුලු) මූල්‍ය තීන්දු ගැනීම සඳහා ඉඩ දෙමින් රාජ්‍ය ව්‍යවසායයන් වානිජමය පදනමක තැබීම හා ඒවා ඉහල මූල්‍ය විනයකට යටත් කිරීම මගින් අය වැයට හා මූල්‍ය පද්ධතියට පවතින අවදානම අඩු කර ගත හැකිය."

ලංකා විදුලි බල මන්ඩලය, ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මන්ඩලය හා ශ්‍රී ලංකා ගුවන් සේවය මෙම ව්‍යවසායයන්ට අයත්වේ. අගමැති රනිල් වික්‍රමසිංහ මෑතදී සඳහන් කලේ මෙම සියලුම රාජ්‍ය ව්‍යවසායයන් පිලිබඳ වගකීම දැරීම සඳහා සිංගප්පූරුවේ ටෙමාසෙක් වැනි ව්‍යවසායක් ඇති කරන බවයි.

එය මෙම ව්‍යවසායයන් මූලික ප්‍රතිව්‍යුහගත කිරීමක් සඳහා වන සූදානමකි. ඉන් අදහස් වන්නේ නව වටයකින් රැකියා කප්පාදු හා වැටුප් හා වැඩ කොන්දේසි මත එල්ල කෙරෙන ප්‍රහාරයකි.

© www.wsws.org